wsws.org World Socialist Web Site
Published by the International Committee of the Fourth International

# ශ්‍රී ලංකාවේ දේශපාලන සම්මුතියක් සඳහා ජාත්‍යන්තර හා සංගත පීඩනය

කේ. රත්නායක විසිනි
2003 නොවැම්බර් 24

ශ්‍රී ලංකාවේ දේශපාලන අර්බුදය එහි සිවුවන සතිය කරා ඇදී යද්දී එක්සත් ජනපදය, යුරෝපීය සංගමය (ඊයූ), ඉන්දියාව හා ජපානය, යම් ආකාරයක සම්මුතියක් අටවා ගන්නා ලෙස ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග සහ අගමැති රනිල් වික්‍රමසිංහ මත තදබල පීඩනයක් යොදමින් සිටිති.

නොවැම්බර් 4 දා, කුමාරතුංග වික්‍රමසිංහගේ එක්සත් ජාතික පෙරමුනු (යූඑන්පී) ආන්ඩුව අත තිබූ ආරක්ෂක, අභ්‍යන්තර කටයුතු සහ මාධ්‍ය අමාත්‍යංශ පවරා ගෙන පාර්ලිමේන්තුව සති දෙකකට අත්හිටුවා, ගැටුම පුපුරුවාලීය. ඇගේ එල්ලය වූයේ, සාම සාකච්ඡාවලට එරෙහිව සිංහල අන්තවාදීන්ගේ පැත්තෙන් සතුරුභාවය වැඩෙන තතු තුල, යූඑන්පී ආන්ඩුව හා දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර රටේ සිවිල් යුද්ධය අවසන් කරනු වස් ගෙනයන සාම සාකච්ඡා කඩාකප්පල් කිරීම යි.

ඉන් පසුව, නෝර්වේජියානු ආන්ඩුව "සාම ක්‍රියාදාමය" තුල සිය මැදිහත්වීම අත්හිටුවා ඇත. නොවැම්බර් 14 දා, කොලඹ දී, විදේශ ඇමති විඩාර් හෙල්ගසන් දේශපාලන තත්වය "පැහැදිලි" වන තෙක් ඔස්ලෝ ආන්ඩුව "සාම ක්‍රියාදාමයෙන්" තාවකාලිකව ඉවත් වන බව නිල වසයෙන් ප්‍රකාශ කලේ ය.

පසුගිය සතියේ මුල, නෝර්වේජියානු විශේෂ නියෝජිත එරික් සොල්හෙයිම්, ඉන්දියානු විදේශ ඇමති යස්වන්ත් සින්හ සහ ආන්ඩුවේ නිලධාරීන් හමුවී සාකච්ඡා යලි ඇරඹුම පිනිස ඔවුන්ගේ සහාය ඉල්ලා සිටියේ ය.

ඉන්දියානු ආන්ඩුව සමග තමන් ගෙනගිය සාකච්ඡාවල ස්වභාවය පෙන්නුම් කරමින්, ආරක්ෂක ඇමති ජෝර්ජ් ෆර්නැන්ඩෙස් ඇතුලු ඉන්දියානු දේශපාලනඥයන් සමග පැවති දිවා භෝජනෝත්සවයක දී සොල්හෙයිම් ප්‍රකාශ කලේ, "ඉන්දියාවේ සහාය නොමැතිව" සාම ක්‍රියාදාමය "කිසි දාක සාර්ථක නො වනු" ඇති බවයි. ඉන්දියාව එම ක්‍රියාදාමය තුල "ප්‍රධාන සාධකයක්" යයි ඔහු තව දුරටත් පැවසී ය.

සාකච්ඡා ඉක්මනින් ම යලි ඇරඹුනේ නැති නම්, යුද්ධයෙන් විනාශයට පත්වූ රට යලි ගොඩනැගුමට ටෝකියෝහි දී ශ්‍රී ලංකාවට ලබා දීමට පොරොන්දු වූ බිලියන ගනනාවක ආධාර පැකේජය අවදානමට ලක් විය හැකැයි අනතුරු ඇඟවීම් නිකුත් වී තිබේ. නොවැම්බර් 12දාට ඉදිරිපත් කිරීමට නියමිතව තිබී එනමුත් සතියකින් කල් තැබුනු රටේ අයවැය යෝජනා තව දුරටත් ප්‍රමාද වුව හොත් එය දරුනු ප්‍රතිවිපාක ඇති කල හැකැයි අනතුරු ඇඟවීම පිනිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත ජෙරමි කාටර් සති දෙකකට ඉහත දී කුමාරතුංග හමුවිය.

"ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික හා දේශපාලන වාතාවරනය ඉක්මනින්ම සාමාන්‍ය තත්වයට යලි පත්වනු දැකීමට ඇමරිකාවේ ව්‍යාපාරික ප්‍රජාව ඉතා කැමැත්තෙන්" සිටින බව, එක්සත් ජනපද වානිජ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ලේකම් මොලි විලියම්සන් ශ්‍රී ලංකාවේ නිදහස් වෙලඳ කලාප භාරව සිටින ආයෝජන මන්ඩලයේ සභාපති අර්ජුන් මහේන්ද්‍රන්ට පැවසී ය. ඩේලි මිරර් පත්‍රයට අනුව, "මෙම රට තුල ආයෝජනය කිරීමෙහි ලා ඇමරිකානුවන් සහභාගි වීමේ අවස්ථාවන් අතිශයින් ම උද්යෝගිමත්" යයි විලියම්සන් තව දුරටත් කී ය. බුෂ් පරිපාලනයේ නිලධාරීහු ජනාධිපතිනියට හා යූඑන්පී ආන්ඩුවට එකට වැඩ කරන ලෙස උපදෙස් දීමෙහි ද නිරතුරුවම යෙදී සිටිති.

මෙම පීඩනයට තව දුරටත් එකතු කරමින්, රටේ ප්‍රධාන ව්‍යාපාරික සංවිධානවලින් සමන්විත ඒකාබද්ධ ව්‍යාපාරික සභාව, පසුගිය අගහරුවාදා, අමාත්‍යංශ තුන ආන්ඩුවට ආපසු භාර දෙන ලෙස ජනාධිපතිනියගෙන් ඉල්ලා සිටින විස්තරාත්මක ලියවිල්ලක් නිකුත් කලේ ය. අගමැතිට "සාම ක්‍රියාදාමයේ" වගකීම සම්පූර්නයෙන් ම භාර දිය යුතු යයි ලියවිල්ල අවධාරනය කලේ ය.

දකුනු ආසියානු කලාපය තුලට එක්සත් ජනපදය කරන මැදිහත්වීමෙන් විවෘත කෙරී ඇති අවස්ථාව ඩැහැ ගැනීමට මහ ව්‍යාපාරිකයෝ දත මැදගෙන සිටිති. සැලකිය යුතු ආර්ථික, දේශපාලනික හා මුලෝපායික අවශ්‍යතාවන් හඹා යන බුෂ් පරිපාලනය, ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂ (බීජේපී) ආන්ඩුවේ සහාය ලබා ගැනීමේ උත්සාහයක යෙදෙමින් සිටින අතර කලාපය අස්ථාවරකරන සාධකයක් ලෙස දැන් සැලකෙන ශ්‍රී ලංකාවේ 20 වසරක සිවිල් යුද්ධය අවසන් කිරීම එයට අවශ්‍ය ය.

මෙම ඉල්ලීම්වලට මුහුන දෙන තතු තුල, ජනාධිපතිනිය හා අගමැති සම්මුතියක් පිලිබඳව සාකච්ඡා කරනු පිනිස පසුගිය අගහරුවාදා දෙවන වතාවටත් හමුවිය. වික්‍රමසිංහ ඊනියා ප්‍රන්ස ආදර්ශය මත පදනම් වන සම්මුතිවාදී "සහජීවන" සූත්‍රයක් යෝජනා කලේ ය. එය යටතේ ආරක්ෂක අමාත්‍යංශය යලි ආන්ඩුවට භාර දිය යුතු අතර කුමාරතුංග සන්නද්ධ හමුදාවන්ගේ ප්‍රධාන අන දෙන නිලධාරිනිය ලෙස "ආරක්ෂක මන්ඩලයක" සභාපතිත්වය දරනු ඇත.

එයට නිල ප්‍රතිචාරයක් දැක්වීමට ඇය අපොහොසත් වූ නමුත්, කුමාරතුංග "අනාගත එකට වැඩ කිරීමේ සම්මුතියක් විස්තරාත්මකව සකසනු" පිනිස නිලධාරීන්ගේ කමිටුවක් පත් කිරීමට අගමැති හා එක්විය. මෙය දෙපාර්ශ්වයට "මෙම වැදගත් ජාතික ප්‍රශ්න සම්බන්ධයෙන් ඒකාබද්ධව වැඩ කිරීමේ" හැකියාව ලබා දෙනු ඇත. ඔවුහු සති දෙකකින් යලි හමුවීමට එකග වූහ.

බදාදා පාර්ලිමේන්තුව යලි විවෘත කෙරුනි. පාර්ලිමේන්තුව කල් තැබීමේ ජනාධිපතිනියගේ ක්‍රියාව "එහි සාමූහික වරප්‍රසාද කඩකිරීමක්" යයි, යූඑන්පී හා සෙසු පක්ෂවල මන්ත්‍රීන් 130ක් තීන්දුවක් සඳහා කල ඉල්ලීමකට ප්‍රතිචාර දනවමින්, කතානායක ජෝශප් මයිකල් පෙරේරා ප්‍රකාශ කලේ ය. ආන්ඩුව අනතුරුව අයවැය ඉදිරිපත් කිරීම කරා පෙරට ගිය අතර කුමාරතුංගගෙන් එයට අභියෝගයක් එල්ල නො වී ය. මෙය කොටස් වෙලඳ පොලේ

ක්ෂනික නැග්මක් ඇති කලේ ය.

ජාත්‍යන්තර ආයෝජකයන් වෙත කෙරුනු පැහැදිලි සංඥාවක් ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරි කාටර්, "හොඳ හා තුලිත" එකක් ලෙස යූඑන්එෆ් අයවැය ප්‍රශංසාවට ලක් කලේ ය. අයවැය මගින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගතකරනයේ නව වටයක්, මහ ව්‍යාපාරිකයන්ට තව දුර සහන මෙන් ම රාජ්‍ය අංශයේ සේවකයන්ට කුඩා වැටුප් වැඩිවීමක් හා ගොවියන්ට පොහොර සහනාධාරයක් ද හඳුන්වා දෙන ලදි. මීට පෙර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැටුප් වැඩිවීම් නොකරන ලෙසත් සහනාධාර තව දුරටත් කප්පාදු කරන ලෙසත් අවධාරනය කොට තිබූ නමුත් ඉහත යෝජනාවන්ට එය දුන් අනුමැතිය මගින් පෙන්නුම් කෙරෙන්නේ, ගැඹුරු වන මහජන නොසන්සුන්තාව ආන්ඩුවේ අර්බුදය තීව්‍ර කරනු ඇතියි එයට පවතින උත්සුකතාව යි.

බ්‍රහස්පතින්දා, යූඑන්එෆ් පාර්ලිමේන්තු සභිකයන්ගේ රැස්වීමකට පසුව, ආන්ඩුවේ ප්‍රකාශක හා යූඑන්එෆ් ඇමති පී.එල්. පීරිස් ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයක දී කියා සිටියේ වික්‍රමසිංහ ජනාධිපතිනිය සමග එකට වැඩ කිරීමේ සැලසුමකට සහභාගි වීමට සූදානම් බවයි. අවශ්‍ය නම්. ඔහු ඇය සමග අවබෝධතා ගිවිසුමක් (එම්ඕයූ) අත්සන් කරනු ඇත. ජනාධිපතිනිය "අගමැති සමග පැවති ආතති සහගත සබඳතා අමතක කර දැමීමට සූදානම්" යයි පසුදින, කුමාරතුංගගේ පොදු පෙරමුනේ ප්‍රකාශක සරත් අමුනුගම ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයක දී පැවසී ය.

ඉන් අනතුරුව එදිනම ඒකාබද්ධ ව්‍යාපාරික සභාව ඉදිරියේ පුද්ගලිකව ම පෙනී සිටි කුමාරතුංග, තමා සහ අගමැති බලය බෙදාගැනීමේ ගිවිසුමක් සැකසීමේ යෙදී සිටින බව ඔවුනට සහතික කලා ය. "නොවැලැක්විය හැකි කොන්දේසි තමන්ට බල කලේ නැති නම්" යලිත් පාර්ලිමේන්තුව නො විසුරුවන බවට පොරොන්දු වෙමින්, තමන් ඒකාබද්ධව පත්කල කමිටුව දෙසැම්බර් 15 දා වන විට වාර්තාවක් නිකුත් කරනු ඇතැයි ඇය කියා සිටියා ය. දින හතක දී යලි ව්‍යාපාරික සංවිධාන හමුවීමට ඇය පොරොන්දු වූ අතර, වික්‍රමසිංහ ද ඉන් පසුව ඔවුන් හමුවනු ඇත.

සිකුරාදා යුරෝපීය පාර්ලිමේන්තුව ඔවුන්ගේ ස්ථාවරය මැනවින් පැහැදිලි කලේ ය. "ජාත්‍යන්තරව සහයෝගය ලැබෙන සාම ක්‍රියාදාමයට තර්ජනය" කල හැකි ජනාධිපතිනියගේ ක්‍රියාමාර්ග විවේචනය කරන සහ එල්ටීටීඊය සමග සාකච්ඡා ඇරඹීමේ ඔවුනගේ "නිර්භීත පියවර" සම්බන්ධයෙන් යූඑන්එෆ් ආන්ඩුව වර්නනා කරන යෝජනාවක් එය සම්මත කලේ ය. "ප්‍රජාතන්ත්‍රිකව තෝරාපත් කර ගැනුනු ආන්ඩුව සමග එකට වැඩ කරන ලෙස" ද යෝජනාව "ජනාධිපතිනියගෙන් ඉල්ලා" සිටියේ ය.

දැන් කුමාරතුංගගේ පාලනය යටතේ පවතින සන්ඩේ ඔබ්සවර් පත්‍රයේ ඊයේ කලාපය එලිදරව් කල පරිදි, ඒකාබද්ධව පත් කෙරුනු කමිටුව, වික්‍රමසිංහ සාම සාකච්ඡාවල පාලනය යලි භාරගත යුතු බවට එකග වී ඇත. සාම සාකච්ඡා පමනක් නො ව, ආරක්ෂාව, ආර්ථිකය, පොලීසිය හා මාධ්‍ය යන "ප්‍රධාන කරුනු" ද සිය සම්මුති ගිවිසුමට ඇතුලු කරගැනීමට කමිටුව බලාපොරොත්තු වන බව එම ලිපිය වාර්තා කලේ ය.

තමන් යා යුතු මග පිලිබඳ ආඥාවන් තමන් හඳුනාගෙන ඇති බව ලන්ඩනයේ ෆිනෑන්ෂල් ටයිම්ස් පත්‍රයේ නොවැම්බර් 15 පලවූ සම්මුඛ සාකච්ජාවක දී කුමාරතුංග පෙන්නුම් කලා ය. තමන් හා අගමැති ගැන සඳහන් කරමින්, ඇය මෙසේ ප්‍රකාශ කලාය, "අඩු ගනනේ දැන් අපි, සාමය හා ආර්ථිකය වැනි සෙසු දේවල් සම්බන්ධයෙන් එකග වී සිටිමු. මෙය එකට වැඩ කිරීමට ඇති ස්වර්නමය අවස්ථාවකි...."

සන්ධානයක් සඳහා යන වැඩකටයුතු තිබිය දීම, සුලුතර පක්ෂ වඩ වඩා නොසන්සුන් වන තතු යටතේ, දේශපාලන තත්වය ආතති සහගත හා දහනශීලී ස්වභාවයෙන් පවතී. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුන (ටියූඑල්එෆ්), දෙමල කොංග්‍රසය (ටීසී) සහ තවත් විවිධ කන්ඩායම්වලින් සමන්විත එල්ටීටීඊ-ගැති දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ), තමන්ට කුමාරතුංග විශ්වාස කල නො හැකි බවට අනතුරු අගවමින්, නිවේදනයක් නිකුත් කර තිබේ.

යූඑන්එෆ් හා පොදු පෙරමුන සර්ව-පාක්ෂික ආන්ඩුවක් තැනීමට තීන්දු කල හොත් දෙමල පක්ෂ එල්ටීටීඊය සමග පෙල ගැසෙනු ඇතැයි, දෙමල කතා කරන වතු කම්කරුවන් මත පදනම් වූ ලංකා කම්කරු සංගමයේ (සීඩබ්ලිව්සී) නායක යූඑන්එෆ් ඇමති ආරුමුගම් තොන්ඩමන්, පසුගිය සඳුදා අනතුරු ඇගවී ය. ටීඑන්ඒ හා සීඩබ්ලිව්සී නායකයන් උත්සුක වී සිටින්නේ දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳව නො ව, කොලඹ ආන්ඩුව හා එල්ටීටීඊය අතර ඇති විය හැකි මොන යම් හෝ දේශපාලන සම්මුතියක දී තමන්ගේ ම තැන රැකගන්නේ කෙසේ ද යන්න ගැනයි.

කුමාරතුංගගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) තුල පවත්නා ගැටුම් ඊටත් වඩා තියුනු ය. යූඑන්එෆ් සමග සම්මුතියක් ගසන ලෙසට ජාත්‍යන්තරව හා ව්‍යාපාරිකයන් වෙතින් එල්ල වන පීඩනයට ජනාධිපතිනිය අනුගත වන අතරතුර, ඇගේ සොහොයුරු අනුර බන්ඩාරනායක ඇතුලු ඇගේ පක්ෂයේ ප්‍රමුඛ කන්ඩායමක් අවධාරනය කරන්නේ, තම පක්ෂය, එල්ටීටීඊය සමග ඇති කර ගැනෙන ඕනෑම සාම සම්මුතියකට සතුරු ජනතාවාදී සිංහල ස්වෝත්තමවාදී සංවිධානයක් වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග සන්ධානයක් තැනිය යුතු බවයි.

කුමාරතුංග, එකිනෙක සමග ගැටෙන අවශ්‍යතා අතර තුලනය වීමේ මංමුලා සහගත ප්‍රයත්නයක යෙදෙමින්, ජවිපෙ සමග සාකච්ජා අඛන්ඩව පවත්වා ගෙන විත් තිබේ. කුමාරතුංග වහාම පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුතු යයි ජවිපෙ කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් කිසිදු එකගතාවකට පැමිනීමට අසමත්ව ඇති නමුත්, ජනාධිපතිනිය පසුගිය සඳුදා පැවති ශ්‍රීලනිප මධ්‍යම කාරක සභා රැස්වීමේ දී "ජවිපෙ සමග එකගතාවක් ඇති කරගැනීම සමාලෝචනය" කරනු පිනිස මධ්‍යම කාරක සභිකයන් සිවු දෙනෙකු පත් කලා ය.

නොවැම්බර් 4 දා කුමාරතුංග ගත් ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරවලින් අනතුරුව, ජවිපෙ ඒවා "අත්‍යවශ්‍ය" පියවර ලෙස වර්නනා කලේ ය. එහෙත් මෙම සංවිධානය, නොවැම්බර් 18 දා නිකුත් කල නිවේදනයක "විදේශීය ප්‍රතිගාමී බලවේග, සිය දේශීය ව්‍යාපාරික හා සෙසු ඒජන්තයන් යොදා ගනිමින්", තමන්ගේ ම අවශ්‍යතා සඳහා අර්බුදය යොදා ගනිමින් සිටී යයි පැමිනිලි කලේ ය. පීඩනය යෙදීම මගින්, ජනාධිපතිනියට බලපෑම් දැමීමෙහි ලා ඔවුහු සාර්ථකත්වය ලබා තිබුනි.

ඊනියා වමේ පක්ෂ, ඔවුන්ගේ පාර්ශ්වයෙන්, මහජනතාවගේ මොන යම් හෝ ස්වාධීන මැදිහත්වීමක් වලක්වා මහා බලවතුන්ගේ න්‍යාය පත්‍රය පිටුපස ඔවුන් සෘජුවම පෙලගස්වනු පිනිස ක්‍රියා කරමින් සිටී. ලංකා සමසමාජ පක්ෂය (ලසසප), කොමියුනිස්ට් පක්ෂය (ශ්‍රීලකොප) හා නව සමසමාජ පක්ෂය (නසසප), අවධාරනය කොට ඇත්තේ, වත්මන් දේශපාලන අර්බුදයට පවත්නා එකම විකල්පය, කුමාරතුංග හා වික්‍රමසිංහ අතර සන්ධානයක් බවයි. "අර්බුදය වහාම විසඳුවේ නැති නම් එය සමස්ත සමාජ වියමන ම අලලා ගත" හැකි බැවින් පාලක පක්ෂ එකිනෙකා කුලල් කෑම නතර කල යුතුයයි, නොවැම්බර් 16 දා නිකුත් කරන ලද සිය මෑතම ප්‍රකාශය තුල, ලසසප-ශ්‍රීලකොප අනතුරු ඇගවී ය.

© ලෝක සමාජවාදී වෙබ් අඩවිය